ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

# **<u>ආචාර්ය බී. ආර්. අම්බෙඩ්කාර් විශ්ව විද්‍යාලය දිල්ලි (AUD) අධ්‍යයන වර්ෂ 2024-25 සඳහා ජාත්‍යන්තර සිසුන් සඳහා උපාධි සහ පශ්චාත් උපාධි අයදුම්පත් කැඳවයි</u>**

ආචාර්ය බී. ආර්. අම්බෙඩ්කාර් විශ්ව විද්‍යාලය දිල්ලි (AUD) අධ්‍යයන විශිෂ්ටත්වය, පර්යේෂණ සහ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාවන් සම්බන්ධයෙන් අන්තර්ග්‍රහණීය අධ්‍යාපනය සඳහා වන කැපවීම සම්බන්ධයෙන් ප්‍රකට විශ්ව විද්‍යාලයකි. මෙම විශ්ව විද්‍යාලය අන්තර් විෂය අධ්‍යාපනය පිළිබඳ දැඩි අවධානයක් සමඟින් විවිධ පුළුල් පරාසයක විවිධ විෂය ක්ෂේත්‍රවල උපාධි සහ පශ්චාත් උපාධි වැඩසටහන් පිරිනමයි. විශ්ව විද්‍යාලය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විචිත්‍රවත් සහ තමන්ගේ උපරිම ධාරිතාවයට ළඟා වීම සඳහා අවකාශ ලබා දෙන අධ්‍යයනමය වශයෙන් උත්තේජනකාරී පරිසරයක් ද ලබා දෙයි.

2. AUD විශ්ව විද්‍යාලය අධ්‍යයන වර්ෂ 2024-25 සඳහා ජාත්‍යන්තර සිසුන් සඳහා උපාධි සහ පශ්චාත් උපාධි අයදුම්පත් කැඳවා ඇත.

3. ජාත්‍යන්තර සිසුන්ට https://audfsradmission.samarth.edu.in/ හරහා සිය අයදුම්පත් යොමු කළ හැකිය. උපාධි සහ පශ්චාත් උපාධි අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2024 ජූනි 15 වේ.

4. අයදුම්කිරීම පිළිබඳ ඕනෑම විමසීමක් dydeania@aud.ac.in යන ඊ-මේල් ලිපිනයෙන් සිදු කළ හැකි අතර වැඩිදුර විස්තර විශ්ව විද්‍යාලයේ වෙබ් අඩවිය වන https://aud.delhi.gov.in/admission/Foreign-Student තුළින් ලබා ගත හැකිය.

***

කොළඹ
2024 ජූනි 03